# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2024 ඔක්තෝබර් 30 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

## 2024 සැප්තැම්බර්

2024 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් අත්කර ගෙන ඇත.

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

2024 සැප්තැම්බර්:

එ.ජ.ඩො. මිලියන 556



11.5 %
ජන. - සැප්.

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ,** 2023 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ දී වූ එ.ජ.ඩො. මිලියන **4,345**ට සාපේක්ෂව 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩො. මිලියන **4,844**ක් විය.

## දළ නිල සංචිත*




** චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.*

දළ නිල සංචිත 2024 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට එ.ජ.ඩො. බිලියන 6.0ක් වූ අතර එය 2024 වසරේ අගෝස්තු අවසානයේ සිට පුළුල් ලෙස නොවෙනස්ව පැවතුණි.

## භාණ්ඩ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය

| 2024 සැප්තැම්බර් | 2024 ජන. - සැප්. |
|---|---|
| අපනයන: එ.ජ.ඩො. මිලියන 1,012 | අපනයන: එ.ජ.ඩො. මිලියන 9,518 |
| ආනයන: එ.ජ.ඩො. මිලියන 1,646 | ආනයන: එ.ජ.ඩො. මිලියන 13,718 |







**වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය** 2024 වසරේ මේ දක්වා වාර්තා වූ ඉහළම මාසික වෙළෙඳ හිඟය වාර්තා කරමින් 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂමය පදනම මත පුළුල් විය.

## සංචාරක ඉපැයීම්

2024 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ දී **සංචාරක ඉපැයීම්** එ.ජ.ඩො. මිලියන **2,348**ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2023 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩො. මිලියන **1,457**ක් ලෙස වාර්තා විය.

### සංචාරක පැමිණීම්

| | |
|---|---|
| 2024 ජන. - සැප්. | 1,484,808 |
| 2023 ජන. - සැප්. | 1,016,256 |

## විනිමය අනුපාතිකය




8.2 %
2024 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට




**එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල,** 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සහ වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළ දී අතිප්‍රමාණය විය.

## සේවා අංශය වෙත වූ ලැබීම්

(සංචාරක ඉපැයීම් හැර)




**සේවා අංශය වෙත වූ ලැබීම්** (සංචාරක ඉපැයීම් හැර) 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී වූ එ.ජ.ඩො. මිලියන **319**ට සාපේක්ෂව 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩො. මිලියන **311**ක් විය.

## රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ (ශුද්ධ)

2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි **විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීම්** අඛණ්ඩව වාර්තා විය.




**ලැබීම්:** එ.ජ.ඩො. මිලියන **7**
**ගෙවීම්:** එ.ජ.ඩො. මිලියන **12**




**ලැබීම්:** එ.ජ.ඩො. මිලියන **222**
**ගෙවීම්:** එ.ජ.ඩො. මිලියන **478**

## කොළඹ කොටස් වෙළඳපොළ (ශුද්ධ)

**කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන** 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.






## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය

වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 377ක සිට 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 634ක් දක්වා පුළුල් වූ අතර ඒ සඳහා සාපේක්ෂව අපනයන ආදායමට වඩා වැඩි වේගයකින් ආනයන වියදම ඉහළ යෑම හේතු විය. 2024 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,341ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,200ක හිඟයක් දක්වා පුළුල් විය.

**රූප සටහන 1: මාසික අපනයන ආදායම**




**රූප සටහන 2: මාසික ආනයන වියදම**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,012ක් දක්වා, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.1කින් ඉහළ ගියේය.** කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පහළ ගියද ඉපැයීම් වල මෙම ඉහළ යෑම සඳහා කාර්මික අපනයන ප්‍රධාන වශයෙන් දායකත්වයක් දැක්විය.

2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව **කාර්මික භාණ්ඩ** අපනයනයන්හි ඉහළ යෑම සඳහා රෙදිපිළි සහ ඇඟලුම් (මූලික වශයෙන් ඇඟලුම්) මෙන්ම ඛනිජතෙල් නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් දායක වූවද 2024 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව මෙම දෙ අංශයෙහිම අපනයන ආදායම පහළ ගියේය. මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම පහළ ගියේය. කුළුබඩු අපනයන ආදායම ඉහළ ගියද, අපනයන පරිමාවන් පහළ යෑම හේතුවෙන් මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ තේ අපනයන ආදායම පහළ යෑම **කෘෂිකාර්මික භාණ්ඩ** අපනයන ආදායම පහළ යෑමට හේතුවිය. **ඛනිජ අපනයන** ආදායම ද 2024 වසරේ සැප්තැම්බර් මාසයේදී පහළ ගියේය.

---

[1] වෙළඳ භාණ්ඩ සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් සංයුතීන්, පිළිවෙළින්, ඇමුණුම II, ඇමුණුම III, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

රූප සටහන 3: අපනයන සංයුතිය

**2024 සැප්තැම්බර් : එ.ජ. ඩො. මිලියන 1,012**
2023 සැප්තැම්බර් : එ.ජ. ඩො. මිලියන 972

**2024 ජන.- සැප්. : එ.ජ. ඩො. මිලියන 9,518**
2023 ජන.- සැප්. : එ.ජ. ඩො. මිලියන 8,982




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[1]

ආනයන වියදම 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,646ක් දක්වා පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 22.0කින් ඉහළ ගියේය. අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනයේ සැලකිය යුතු වැඩිවීමත් සමග, සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩයන්හි ආනයන වියදම ඉහළ ගියේය.

රූප සටහන 4: ආනයන සංයුතිය

**2024 සැප්තැම්බර් : එ.ජ. ඩො. මිලියන 1,646**
2023 සැප්තැම්බර් : එ.ජ. ඩො. මිලියන 1,349

**2024 ජන.- සැප්. : එ.ජ. ඩො. මිලියන 13,718**
2023 ජන.- සැප්. : එ.ජ. ඩො. මිලියන 12,323




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී **පාරිභෝගික භාණ්ඩ** ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ඉහළ යෑම සඳහා ආහාර හා පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයේම ආනයන පුළුල් පදනමක් මත ඉහළ යෑම හේතු විය. මේ අතර, 2023 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව **අන්තර් භාණ්ඩ** ආනයන වියදම ඉහළ යෑමට මූලික වශයෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයනය ඉහළ යෑම හේතු වූ අතර රසායනික නිෂ්පාදන ආනයනයෙහි ද කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබිණි. කෙසේ වෙතත්, 2024 සැප්තැම්බර් මාසයේදී බොරතෙල් ආනයනය කළද, ආනයන මිල සහ පරිමාව යන දෙඅංශයම පහළ යෑම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම පහළ යෑමෙන් ඉන්ධන ආනයන වියදම පහළ ගියේය. **ආයෝජන භාණ්ඩ** සඳහා වූ වියදම ද ඉහළ ගිය අතර යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම (මූලික වශයෙන් දොඹකර) ඉහළ යෑම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

## වෙළඳ දර්ශක[2]

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය**, 2023 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 1.2කින් පහළ ගිය අතර, ඒ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී අපනයන ආදායම 2023 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඉහළ යෑම සඳහා අපනයන පරිමාව ඉහළ යෑම හේතු වූ බව නිරූපණය කරමින් අපනයන පරිමා දර්ශකය සියයට 10.3කින් ඉහළ ගිය අතර, අපනයන ඒකක මිල දර්ශකය සියයට 5.6කින් පහළ ගියේය.

එසේම, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආනයන වියදම 2023 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඉහළ යෑම සඳහා ද ඉහළ පරිමාවන් හේතු වූ බව නිරූපණය කරමින් ආනයන පරිමා දර්ශකය සියයට 27.6කින් ඉහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 4.4කින් පහළ ගියේය.

**රූප සටහන 5: වෙළඳ මිල අනුපාතය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: අපනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[2] එ.ජ. ඩොලර් වටිනාකම අනුව

## සේවා අංශයේ ක්‍රියාකාරීත්වය[3]

**සංචාරක ඉපැයීම්:** 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සංචාරක ඉපැයීම්, 2024 වසරේ අගෝස්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 282ට සහ 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 152ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 181ක් ලෙස පැවතුණි.

**රූප සටහන 8: මාසික සංචාරක ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: මාසික සංචාරක පැමිණීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**සේවා අංශයේ අනෙකුත් ලැබීම්[4]:** 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා අංශය (සංචාරක ඉපැයීම් හැර) වෙත වූ මුළු ලැබීම් 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 319ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 311ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා අංශය වෙත වූ ලැබීම් සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ මුහුදු ප්‍රවාහන සහ පරිගණක හා තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවාවන් වෙත වූ ලැබීම්ය.

**රූප සටහන 10: සේවා අංශය වෙත වූ ප්‍රධාන ලැබීම් (සංචාරක ඉපැයීම් හැර)**

**2024 සැප්තැම්බර්: එ.ජ. ඩො. මිලියන 311**

2023 සැප්තැම්බර්: එ.ජ. ඩො. මිලියන 319




**2024 ජන. - සැප්.: එ.ජ. ඩො. මිලියන 2,757**

2023 ජන. - සැප්.: එ.ජ. ඩො. මිලියන 2,497




මූලය: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

---

[3] ශ්‍රී ලංකා මහ බැංකුව සිය අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) මත පදනම්ව, උප කාණ්ඩවල දත්ත ද ඇතුළත් වන පරිදි, 2024 වසරේ ජනවාරි මාසයේ සිට සේවා අංශයේ සංඛ්‍යාලේඛන මාසිකව වාර්තා කරයි.

[4] තාවකාලික

**සේවා අංශයේ ගෙවීම්[5]:** 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා අංශය වෙතින් වූ මුළු ගෙවීම්, 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 162ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 336ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා අංශය වෙතින් වූ ගෙවීම් සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ විදේශ සංචාර සහ ගුවන් ප්‍රවාහන සේවාවන්ය.

**රූප සටහන 11: සේවා අංශයේ ප්‍රධාන ගෙවීම්**

**2024 සැප්තැම්බර්: එ.ජ. ඩො. මිලියන 336**

2023 සැප්තැම්බර්: එ.ජ. ඩො. මිලියන 162

**2024 ජන. - සැප්.: එ.ජ. ඩො. මිලියන 2,349**

2023 ජන. - සැප්.: එ.ජ. ඩො. මිලියන 1,468




මූලය: අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2024 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 577ට සාපේක්ෂව 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 556ක් ලෙස සුළු වශයෙන් අඩු වූ නමුත් 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 482ට සාපේක්ෂව එය සැලකිය යුතු ඉහළ අගයකි. 2024 වසරේ මාර්තු මාසයේ සිට මාසික විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 500ක අගය ඉක්මවා ඇත.

**රූප සටහන 12: මාසික විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

5 තාවකාලික

## මූල්‍ය ලැබීම්

2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි එ.ජ. ඩොලර් මිලියන 5ක විදේශ ආයෝජනවල ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 256ක සමුච්චිත ශුද්ධ ගෙවීමක් වාර්තා විය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත්, කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ලැබීම්, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 2ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, 2024 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 43ක සමස්ත ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

දළ නිල සංචිත 2023 වසර අවසානයට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 1.6ක පමණ ඉහළ යෑමක් වාර්තා කරමින් 2024 වසරේ සැප්තැම්බර් මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 6.0ක් විය. චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීමේ දී ඇතැම් කොන්දේසිවලට යටත් වේ. 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 96ක විදේශ විනිමය ශුද්ධ මිලදී ගැනීම් (වෙළඳ දිනය මත පදනම්ව) සිදු කර ඇත. මේ අතර, දළ නිල සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත්ව) මඟින් ආවරණය කළ හැකි ආනයන ප්‍රමාණය 2024 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට ආනයනික මාස 3.9ක් විය.

**රූප සටහන 13: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණයවීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.** වසර තුළ දී වූ සමස්ත අතිප්‍රමාණයවීම හා අනුරූපීව 2024 වසරේ ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු අතිප්‍රමාණයවීමක් වාර්තා කළේය. 2024 වසරේ ඔක්තෝබර් මස 30 දක්වා වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 10.3කින් අතිප්‍රමාණය විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2024 වසරේ ඔක්තෝබර් මස 30 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ, ස්ටර්ලින් පවුම, චීන යුවාන්, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියලෙහි 2024 වසරේ සැප්තැම්බර් මස දක්වා වසර තුළ වූ නාමික අතිප්‍රමාණයට අනුකූලව මුදල් වර්ග 24කින් සැදුම් ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ. 24) ද අතිප්‍රමාණය විය. ඒ අනුව, මෙම කාලපරිච්ඡේදය තුළ දී විදේශීය තරඟකාරීත්වයෙහි අඩු වීමක් පිළිඹිබු කරමින්, මූ.ස.වි.අ. 24හි දර්ශකය 2023 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට පැවති 70.2ක සිට 2024 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට 72.6ක් දක්වා ඉහළ ගියේය.

**රූප සටහන 14: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 15: විනිමය අනුපාතිකයෙහි සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස් වීම**

**(2023 වසරේ දෙසැම්බර් මස අවසානයේ සිට 2024 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 1: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2022 | 2023 | 2024 (ඔක්. 30 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -44.8% | +12.1% | +10.3% |
| යූරෝ | -41.4% | +7.9% | +12.9% |
| ස්ටර්ලින් පවුම | -38.1% | +6.0% | +8.0% |
| චීන යුවාන් (රෙන්මින්බි) | -39.8% | +14.3% | +10.9% |
| ජපන් යෙන් | -36.4% | +19.5% | +19.7% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -40.8% | +10.8% | +15.1% |
| ඉන්දියානු රුපියල | -38.6% | +12.6% | +11.5% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

*ඉදිරි දින දර්ශනයට අනුව, 2024 වසරේ ඔක්තෝබර් මාසය සඳහා වන විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පුවත්පත් නිවේදනය **2024 වසරේ නොවැම්බර් මස 29** වන දින නිකුත් කරනු ඇත.*

ඇමුණුම I :

**වෙළඳ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)**

| කාණ්ඩය | සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 971.9 | 1,011.7 | 4.1 | 8,982.0 | 9,518.1 | 6.0 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,349.3 | 1,645.7 | 22.0 | 12,323.4 | 13,718.3 | 11.3 |
| වෙළඳ ශේෂය | -377.4 | -634.0 | | -3,341.3 | -4,200.2 | |
| සේවා ගිණුමේ ශේෂය (ශුද්ධ) | 308.8 | 156.1 | -49.5 | 2,486.0 | 2,755.8 | 10.9 |
| සේවා අංශයට වූ ලැබීම් | 471.3 | 492.0 | 4.4 | 3,953.6 | 5,105.3 | 29.1 |
| *ඒවායින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් | 152.2 (ආ) | 181.0 (ඇ) | 18.9 | 1,456.7 (ආ) | 2,348.0 (ඇ) | 61.2 |
| මුහුදු ප්‍රවාහනය | 67.8 | 111.6 | 64.5 | 580.0 | 821.5 | 41.6 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම් යන සේවා | 75.0 | 66.4 | -11.4 | 593.3 | 636.3 | 7.2 |
| ගුවන් ප්‍රවාහනය | 58.9 | 33.1 | -43.7 | 567.3 | 478.2 | -15.7 |
| සේවා අංශයේ ගෙවීම් | 162.5 | 336.0 | 106.8 | 1,467.6 | 2,349.5 | 60.1 |
| *ඒවායින්,* | | | | | | |
| විදේශ සංචාර | 17.8 | 103.9 | 483.1 | 109.3 | 565.2 | 417.2 |
| ගුවන් ප්‍රවාහනය | 33.8 | 66.7 | 96.9 | 329.7 | 411.2 | 24.7 |
| මුහුදු ප්‍රවාහනය | 17.7 | 42.7 | 140.9 | 193.0 | 274.0 | 41.9 |
| නිෂ්පාදන සේවා | 12.9 | 25.5 | 97.9 | 149.4 | 175.6 | 17.5 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 482.4 | 555.6 | 15.2 | 4,345.1 | 4,843.8 | 11.5 |
| පුද්ගලික සංක්‍රාම සඳහා ගෙවීම් | 9.6 | 17.1 | | 155.0 | 117.3 | |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -4.5 | -1.9 | | 10.9 | 42.5 | |
| රාජ්‍ය සුරකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශ විනිමය ලැබීම් | -16.9 | -4.9 | | 334.7 | -256.3 | |
| සමස්ත ශේෂය | | | | 1,862.9 | 2,284.9 | |
| ***විශේෂිත අයිතමයන්*** | | | | | | |
| සංචාරක පැමිණීම් | 111,938 | 122,140 | | 1,016,256 | 1,484,808 | |
| විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් | 25,812 | 28,726 | | 224,099 | 234,655 | |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2023 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඇ) 2024 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත්ව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

ඇමුණුම II:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **724.5** | **776.3** | **7.2** | **6,998.1** | **7,442.2** | **6.3** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 43.2 | 46.3 | 7.1 | 397.7 | 474.0 | 19.2 |
| සත්ත්ව ආහාර | 8.9 | 10.2 | 14.5 | 111.0 | 99.9 | -10.1 |
| රෙදිපිළි හා ඇඟලුම් | 363.0 | 419.3 | 15.5 | 3,688.7 | 3,784.1 | 2.6 |
| එයින්, ඇඟලුම් | 325.2 | 389.0 | 19.6 | 3,345.5 | 3,479.0 | 4.0 |
| රෙදිපිළි | 29.2 | 22.2 | -24.1 | 266.8 | 224.3 | -15.9 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 8.6 | 8.2 | -4.8 | 76.4 | 80.9 | 5.9 |
| රබර් නිෂ්පාදිත | 80.6 | 77.2 | -4.2 | 668.6 | 740.2 | 10.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 41.3 | 24.6 | -40.4 | 394.3 | 306.7 | -22.2 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 46.9 | 32.7 | -30.2 | 465.5 | 368.8 | -20.8 |
| ප්‍රවාහන උපකරණ | 6.3 | 5.8 | -7.8 | 124.6 | 75.2 | -39.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 45.9 | 74.4 | 62.0 | 371.6 | 784.1 | 111.0 |
| රසායනික නිෂ්පාදිත | 16.2 | 19.3 | 19.3 | 142.6 | 172.1 | 20.7 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.7 | 8.4 | -21.7 | 87.1 | 93.9 | 7.8 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.0 | 4.8 | 138.6 | 44.6 | 35.3 | -20.8 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.3 | 5.0 | -31.4 | 55.1 | 46.3 | -15.9 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 4.7 | 4.1 | -11.7 | 42.1 | 40.6 | -3.6 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 18.2 | 13.9 | -23.4 | 133.8 | 141.8 | 6.0 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.9 | 2.7 | -7.0 | 25.7 | 25.0 | -2.9 |
| වෙනත් කාර්මික අපනයන | 26.5 | 27.7 | 4.6 | 245.2 | 254.1 | 3.7 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **242.5** | **232.3** | **-4.2** | **1,945.4** | **2,036.3** | **4.7** |
| තේ | 120.0 | 117.0 | -2.4 | 990.3 | 1,059.3 | 7.0 |
| රබර් | 2.3 | 2.3 | -0.4 | 23.5 | 18.7 | -20.6 |
| පොල් | 32.4 | 35.6 | 9.8 | 256.4 | 307.8 | 20.0 |
| කුළුබඩු | 37.8 | 46.7 | 23.4 | 298.5 | 316.2 | 5.9 |
| එළවළු | 2.5 | 1.9 | -25.5 | 20.5 | 20.4 | -0.3 |
| සකස් නොකළ දුම්කොළ | 1.6 | 2.6 | 63.0 | 19.8 | 18.3 | -7.6 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 20.2 | 11.3 | -44.0 | 143.5 | 116.3 | -18.9 |
| මුහුදු ආහාර | 25.7 | 14.8 | -42.2 | 193.0 | 179.4 | -7.0 |
| **3. ඛනිජ අපනයන** | **2.3** | **0.9** | **-61.7** | **18.0** | **19.6** | **9.4** |
| **4. වර්ග නොකළ අපනයන** | **2.6** | **2.3** | **-14.6** | **20.5** | **20.0** | **-2.8** |
| **මුළු අපනයන** | **971.9** | **1,011.7** | **4.1** | **8,982.0** | **9,518.1** | **6.0** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම III:

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)**

| කාණ්ඩය | සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **253.0** | **244.0** | **-3.6** | **2,076.9** | **2,197.2** | **5.8** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 28.8 | 19.7 | -31.5 | 221.0 | 215.3 | -2.6 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 7.6 | 5.0 | -34.7 | 57.8 | 54.7 | -5.4 |
| 05 එළවළු හා පලතුරු | 43.7 | 37.7 | -13.6 | 320.5 | 358.9 | 12.0 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 158.2 | 165.3 | 4.5 | 1,286.8 | 1,376.8 | 7.0 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **12.3** | **11.1** | **-10.2** | **116.8** | **121.4** | **3.9** |
| 11 පාන වර්ග | 5.6 | 4.2 | -25.1 | 48.5 | 57.5 | 18.5 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 6.7 | 6.9 | 2.2 | 68.3 | 63.9 | -6.5 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **33.2** | **28.3** | **-14.9** | **292.8** | **287.5** | **-1.8** |
| 23 සකස් නොකළ රබර් | 2.5 | 2.4 | -2.5 | 24.5 | 19.8 | -19.4 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 19.4 | 18.4 | -5.1 | 171.3 | 170.6 | -0.4 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **45.9** | **74.4** | **62.0** | **371.6** | **784.1** | **111.0** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 45.9 | 73.7 | 60.6 | 371.6 | 726.3 | 95.5 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | 0.6 | - | - | 57.7 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **7.3** | **8.5** | **17.3** | **51.6** | **64.4** | **24.9** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 7.0 | 7.4 | 5.5 | 49.9 | 60.7 | 21.5 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **18.9** | **23.5** | **24.5** | **173.9** | **207.4** | **19.3** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **166.2** | **134.8** | **-18.9** | **1,431.1** | **1,383.3** | **-3.3** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 61.7 | 55.0 | -10.8 | 500.3 | 542.9 | 8.5 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 33.8 | 29.5 | -12.8 | 308.0 | 293.2 | -4.8 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 46.6 | 31.3 | -32.8 | 440.8 | 353.6 | -19.8 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **52.1** | **37.6** | **-28.0** | **576.6** | **433.1** | **-24.9** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 26.7 | 20.0 | -25.0 | 276.3 | 209.6 | -24.2 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **383.0** | **449.7** | **17.4** | **3,890.5** | **4,039.5** | **3.8** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 348.9 | 414.0 | 18.7 | 3,547.3 | 3,704.4 | 4.4 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **-** | **-** | **-** | **0.3** | **0.3** | **-13.1** |
| **මුළු අපනයන** | **971.9** | **1,011.7** | **4.1** | **8,982.0** | **9,518.1** | **6.0** |

(අ) තාවකාලික.

…සැලකිය යුතු නොවේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම IV:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **214.2** | **280.2** | **30.8** | **2,242.5** | **2,456.6** | **9.5** |
| ආහාර හා පාන වර්ග | 108.6 | 143.3 | 32.0 | 1,266.6 | 1,357.4 | 7.2 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.6 | 13.9 | 202.5 | 95.2 | 100.9 | 6.0 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 15.0 | 23.2 | 54.9 | 221.4 | 164.1 | -25.9 |
| එළවළු (ආ) | 23.9 | 27.1 | 13.1 | 271.3 | 329.6 | 21.5 |
| මුහුදු ආහාර | 6.6 | 5.8 | -11.6 | 49.9 | 84.6 | 69.6 |
| සීනි හා රසකැවිලි | 26.5 | 31.5 | 19.1 | 315.9 | 285.1 | -9.8 |
| කුළුබඩු | 9.5 | 7.0 | -26.4 | 95.9 | 82.3 | -14.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.5 | 34.7 | 54.5 | 217.0 | 310.9 | 43.3 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 105.7 | 137.0 | 29.6 | 976.0 | 1,099.2 | 12.6 |
| පෞද්ගලික රථවාහන | 2.4 | 10.1 | 321.7 | 19.9 | 56.1 | 181.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 45.2 | 46.6 | 3.0 | 511.4 | 409.6 | -19.9 |
| ගෘහ උපකරණ | 6.9 | 11.0 | 60.5 | 43.9 | 107.5 | 145.0 |
| රෙදිපිළි හා උපාංග | 15.4 | 18.7 | 21.5 | 124.0 | 156.4 | 26.1 |
| විදුලි සංදේශ උපකරණ | 8.5 | 14.7 | 72.7 | 60.9 | 98.0 | 60.8 |
| ගෘහ හා දැව භාණ්ඩ | 11.6 | 13.5 | 16.9 | 81.1 | 97.8 | 20.6 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 15.8 | 22.5 | 42.1 | 134.8 | 173.9 | 29.0 |
| **2. අන්තර් භාණ්ඩ** | **919.8** | **1,040.4** | **13.1** | **8,105.3** | **8,790.4** | **8.5** |
| ඉන්ධන | 396.7 | 375.9 | -5.2 | 3,476.3 | 3,272.5 | -5.9 |
| එයින්, බොරතෙල් | - | 63.9 | - | 797.2 | 634.0 | -20.5 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 363.0 | 281.4 | -22.5 | 2,304.2 | 2,437.3 | 5.8 |
| ගල්අඟුරු | 33.8 | 30.7 | -9.2 | 374.9 | 201.2 | -46.3 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 15.4 | 11.5 | -25.1 | 194.6 | 179.3 | -7.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 176.6 | 241.3 | 36.6 | 1,760.6 | 2,080.6 | 18.2 |
| කඩදාසි හා ඝන කඩදාසි | 27.7 | 41.0 | 48.1 | 298.8 | 333.6 | 11.7 |
| කෘෂිකාර්මික යෙදවුම් | 15.9 | 21.1 | 32.9 | 182.1 | 195.7 | 7.5 |
| තිරිඟු හා ඉරිඟු | 62.2 | 48.6 | -21.8 | 264.0 | 253.1 | -4.2 |
| මූල ලෝහ | 26.9 | 35.7 | 32.7 | 235.9 | 353.7 | 49.9 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 39.5 | 53.6 | 35.7 | 335.9 | 439.5 | 30.8 |
| රසායනික නිෂ්පාදිත | 65.7 | 88.7 | 35.0 | 593.3 | 745.8 | 25.7 |
| පොහොර | 22.0 | 23.7 | 8.0 | 161.8 | 126.6 | -21.7 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 17.0 | 29.5 | 73.6 | 137.2 | 231.2 | 68.5 |
| ඛනිජ නිෂ්පාදිත | 8.2 | 10.7 | 29.8 | 54.3 | 96.2 | 77.2 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 45.9 | 58.9 | 28.3 | 410.5 | 482.7 | 17.6 |
| **3. ආයෝජන භාණ්ඩ** | **215.0** | **324.7** | **51.0** | **1,963.0** | **2,465.1** | **25.6** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 136.7 | 227.7 | 66.6 | 1,355.7 | 1,666.3 | 22.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 66.0 | 84.0 | 27.2 | 547.4 | 685.9 | 25.3 |
| ප්‍රවාහන උපකරණ | 12.0 | 12.8 | 6.8 | 57.6 | 110.9 | 92.4 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.3 | -24.9 | 2.3 | 2.1 | -8.9 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.2** | **0.4** | **46.7** | **12.6** | **6.2** | **-50.6** |
| **මුළු ආනයන** | **1,349.3** | **1,645.7** | **22.0** | **12,323.4** | **13,718.3** | **11.3** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **952.5** | **1,269.8** | **33.3** | **8,847.1** | **10,445.8** | **18.1** |

(අ) තාවකාලික.
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම V:

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **181.9** | **199.8** | **9.8** | **1,649.1** | **1,692.1** | **2.6** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 16.5 | 23.2 | 40.6 | 230.5 | 170.3 | -26.1 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 6.7 | 6.0 | -10.8 | 50.7 | 85.8 | 69.1 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 66.4 | 62.1 | -6.5 | 358.1 | 350.5 | -2.1 |
| 05 එළවළු හා පලතුරු | 26.9 | 31.4 | 16.7 | 301.1 | 377.9 | 25.5 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 26.5 | 31.5 | 19.2 | 315.9 | 285.1 | -9.8 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 14.1 | 14.0 | -0.2 | 129.7 | 131.7 | 1.6 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **11.2** | **13.7** | **21.9** | **89.2** | **90.3** | **1.2** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **28.5** | **44.4** | **56.0** | **238.9** | **336.9** | **41.0** |
| 23 සකස් නොකළ රබර් | 13.4 | 26.8 | 100.0 | 104.6 | 197.4 | 88.8 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 2.1 | 1.7 | -17.5 | 31.2 | 12.4 | -60.1 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **396.7** | **375.9** | **-5.2** | **3,476.3** | **3,272.5** | **-5.9** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 330.6 | 316.0 | -4.4 | 2,888.8 | 2,807.1 | -2.8 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 32.3 | 29.3 | -9.6 | 212.7 | 264.2 | 24.2 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **9.1** | **19.2** | **111.6** | **124.8** | **194.2** | **55.7** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 8.2 | 17.6 | 113.9 | 116.8 | 181.7 | 55.6 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **168.1** | **211.3** | **25.7** | **1,570.9** | **1,689.5** | **7.6** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 40.6 | 42.3 | 4.3 | 475.2 | 370.7 | -22.0 |
| 56 පොහොර | 22.0 | 23.7 | 8.1 | 161.6 | 126.0 | -22.0 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 26.5 | 38.0 | 43.3 | 214.8 | 297.2 | 38.3 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 9.6 | 13.1 | 36.5 | 97.2 | 107.6 | 10.7 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **332.3** | **427.4** | **28.6** | **3,110.0** | **3,769.7** | **21.2** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 25.6 | 38.2 | 49.2 | 289.0 | 317.7 | 9.9 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 171.8 | 235.4 | 37.0 | 1,703.6 | 2,037.4 | 19.6 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 33.3 | 36.4 | 9.2 | 350.2 | 392.4 | 12.0 |
| 67 යකඩ හා වානේ | 45.2 | 45.8 | 1.4 | 318.4 | 455.1 | 42.9 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **156.0** | **280.5** | **79.8** | **1,521.8** | **2,056.9** | **35.2** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 19.7 | 30.4 | 54.6 | 187.0 | 280.4 | 49.9 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 26.4 | 104.8 | 297.0 | 256.1 | 482.8 | 88.5 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 10.8 | 19.3 | 78.6 | 101.2 | 127.4 | 25.9 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 22.5 | 32.2 | 43.1 | 172.9 | 270.4 | 56.4 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 48.5 | 46.1 | -5.0 | 410.9 | 437.0 | 6.4 |
| 78 රථවාහන | 10.1 | 25.5 | 151.8 | 101.7 | 165.1 | 62.3 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **65.2** | **73.2** | **12.3** | **532.0** | **609.2** | **14.5** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 12.4 | 16.1 | 29.4 | 107.8 | 135.8 | 26.0 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 15.9 | 14.1 | -11.6 | 114.9 | 112.1 | -2.5 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.3** | **0.3** | **12.8** | **10.5** | **7.1** | **-32.6** |
| **මුළු ආනයන** | **1,349.3** | **1,645.7** | **22.0** | **12,323.4** | **13,718.3** | **11.3** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම VI:

## සේවා ගිණුම - ලැබීම් (අ)

| | සැප්තැම්බර් 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්තැම්බර් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **471.3** | **492.0** | **4.4** | **3,953.6** | **5,105.3** | **29.1** |
| **නිෂ්පාදන සේවා** | **0.9** | **0.6** | **-28.4** | **13.5** | **24.8** | **83.8** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **3.3** | **9.1** | **178.4** | **32.4** | **49.8** | **53.4** |
| **ප්‍රවාහනය** | **126.7** | **144.8** | **14.2** | **1,147.5** | **1,300.4** | **13.3** |
| මුහුදු ප්‍රවාහනය | 67.8 | 111.6 | 64.5 | 580.0 | 821.5 | 41.6 |
| මඟී ගාස්තු | 0.01 | 0.03 | 99.3 | 0.1 | 1.2 | |
| නැව් කුලී | 27.2 | 76.0 | 179.3 | 298.9 | 510.4 | 70.8 |
| වෙනත් | 40.6 | 35.5 | -12.5 | 281.0 | 309.8 | 10.3 |
| ගුවන් ප්‍රවාහනය | 58.9 | 33.1 | -43.7 | 567.3 | 478.2 | -15.7 |
| මඟී ගාස්තු | 22.8 | 23.1 | 1.3 | 232.1 | 212.5 | -8.4 |
| ගුවන් කුලී | 4.7 | 4.4 | -7.4 | 65.2 | 38.7 | -40.6 |
| වෙනත් | 31.4 | 5.7 | -81.8 | 270.0 | 227.0 | -15.9 |
| තැපැල් සේවා | 0.02 | 0.03 | 54.1 | 0.2 | 0.6 | 221.2 |
| **සංචාරක** | **152.2** | **181.0** | **18.9** | **1,456.7** | **2,348.0** | **61.2** |
| **ඉදිකිරීම්** | **63.3** | **19.7** | **-68.9** | **274.1** | **168.9** | **-38.4** |
| විදේශයන්හි ඉදිකිරීම් | 2.3 | 3.6 | 56.2 | 26.6 | 17.1 | -35.9 |
| දේශීය ඉදිකිරීම් | 19.4 | 9.9 | -49.1 | 140.7 | 78.4 | -44.3 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 41.6 | 6.2 | -85.0 | 106.8 | 73.5 | -31.2 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **1.4** | **0.9** | **-34.9** | **27.1** | **18.6** | **-31.2** |
| සෘජු රක්ෂණය | 1.2 | 0.9 | -26.7 | 24.8 | 15.9 | -36.1 |
| ප්‍රතිරක්ෂණය | 0.2 | 0.0 | -95.0 | 2.3 | 2.8 | 22.1 |
| **මූල්‍ය සේවා** | **4.1** | **1.8** | **-57.4** | **44.6** | **44.9** | **0.7** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **1.1** | **0.1** | **-90.4** | **8.8** | **5.1** | **-42.0** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **83.8** | **70.2** | **-16.2** | **693.1** | **729.9** | **5.3** |
| විදුලි සංදේශ සේවා | 8.8 | 3.8 | -57.0 | 99.8 | 93.5 | -6.28 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම් යන සේවා | 75.0 | 66.4 | -11.4 | 593.3 | 636.3 | 7.2 |
| පරිගණක සේවා | 74.5 | 65.9 | -11.5 | 587.2 | 631.4 | 7.5 |
| තොරතුරු සේවා | 0.6 | 0.5 | -5.1 | 6.1 | 4.9 | -19.9 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **33.2** | **53.9** | **62.5** | **226.4** | **369.4** | **63.1** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 1.9 | 5.0 | 165.1 | 14.7 | 35.7 | 142.3 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 18.5 | 26.8 | 44.9 | 93.0 | 150.3 | 61.6 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 12.8 | 22.1 | 72.8 | 118.7 | 183.4 | 54.5 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **1.2** | **0.7** | **-42.0** | **25.6** | **14.4** | **-43.7** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.01 | 0.3 | | 1.1 | 5.0 | 359.5 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 1.2 | 0.4 | -69.8 | 24.5 | 9.4 | -61.7 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **0.1** | **9.2** | | **3.8** | **31.1** | |

(අ) තාවකාලික. සංචාරක ඉපැයීම් හැර අනෙකුත් සියලුම දත්ත අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වේ. සංචාරක ඉපැයීම් දත්ත, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කරන ලද සමීක්ෂණය මත පදනම් වේ.

**මූලයන්:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ඇමුණුම VII:

## සේවා ගිණුම - ගෙවීම් (අ)

| | සැප්තැම්බර් 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්තැම්බර් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **162.5** | **336.0** | **106.8** | **1,467.6** | **2,349.5** | **60.1** |
| **නිෂ්පාදන සේවා** | **12.9** | **25.5** | **97.9** | **149.4** | **175.6** | **17.5** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **3.0** | **0.9** | **-70.7** | **7.2** | **11.3** | **55.5** |
| **ප්‍රවාහනය** | **53.1** | **109.7** | **106.4** | **526.5** | **689.3** | **30.9** |
| මුහුදු ප්‍රවාහනය | 17.7 | 42.7 | 140.9 | 193.0 | 274.0 | 41.9 |
| මගී ගාස්තු | 1.0 | 0.39 | -59.5 | 2.5 | 0.9 | -63.1 |
| නැව් කුලී | 15.1 | 37.5 | 148.5 | 166.1 | 256.6 | 54.5 |
| වෙනත් | 1.7 | 4.8 | 188.8 | 24.5 | 16.5 | -32.7 |
| ගුවන් ප්‍රවාහනය | 33.8 | 66.7 | 96.9 | 329.7 | 411.2 | 24.7 |
| මගී ගාස්තු | 22.4 | 20.0 | -10.6 | 190.7 | 212.9 | 11.6 |
| ගුවන් කුලී | 2.3 | 28.7 | | 56.8 | 106.3 | 87.3 |
| වෙනත් | 9.2 | 18.0 | 96.2 | 82.2 | 92.0 | 12.0 |
| තැපැල් සේවා | 1.6 | 0.3 | -79.2 | 3.8 | 4.1 | 8.2 |
| **සංචාරක** | **17.8** | **103.9** | **483.1** | **109.3** | **565.2** | **417.2** |
| **ඉදිකිරීම්** | **7.1** | **6.2** | **-13.1** | **77.6** | **108.5** | **39.9** |
| විදේශයන්හි ඉදිකිරීම් | 0.001 | 0.1 | | 1.2 | 26.8 | |
| දේශීය ඉදිකිරීම් | 3.5 | 0.1 | -98.3 | 41.2 | 13.2 | -67.9 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 3.6 | 6.1 | 69.3 | 35.3 | 68.5 | 94.1 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **4.1** | **5.3** | **29.0** | **37.7** | **46.4** | **23.0** |
| සෘජු රක්ෂණය | 1.4 | 1.0 | -26.3 | 8.9 | 9.5 | 6.8 |
| ප්‍රතිරක්ෂණය | 2.7 | 4.2 | 58.1 | 28.8 | 36.9 | 28.0 |
| **මූල්‍ය සේවා** | **4.8** | **2.1** | **-56.2** | **38.1** | **50.2** | **32.0** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **9.0** | **13.3** | **48.1** | **59.0** | **105.3** | **78.6** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **18.5** | **25.6** | **38.4** | **193.7** | **180.8** | **-6.7** |
| විදුලි සංදේශ සේවා | 4.5 | 5.7 | 25.8 | 38.2 | 42.0 | 9.7 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 13.9 | 19.9 | 42.6 | 155.5 | 138.8 | -10.8 |
| පරිගණක සේවා | 10.5 | 19.0 | 80.6 | 112.1 | 119.7 | 6.8 |
| තොරතුරු සේවා | 3.4 | 0.9 | -74.4 | 43.4 | 19.0 | -56.1 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **31.6** | **42.9** | **35.8** | **255.2** | **405.1** | **58.7** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 5.8 | 7.6 | 31.7 | 54.3 | 75.4 | 39.0 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 11.4 | 11.2 | -2.2 | 87.4 | 145.9 | 66.9 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 14.4 | 24.1 | 67.6 | 113.6 | 183.8 | 61.8 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **0.4** | **0.3** | **-24.2** | **7.6** | **9.4** | **24.2** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.0004 | 0.2 | | 4.1 | 8.4 | 103.7 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 0.4 | 0.11 | -73.6 | 3.5 | 1.0 | -69.9 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **0.1** | **0.3** | **406.9** | **6.3** | **2.4** | **-61.2** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම VIII:

## සේවා ගිණුම - ශුද්ධ (අ)

| | සැප්තැම්බර් 2023 (එ.ජ.ඩො. මිලියන) | සැප්තැම්බර් 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-සැප්. 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-සැප්. 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **308.8** | **156.1** | **-49.5** | **2,486.0** | **2,755.8** | **10.9** |
| **නිෂ්පාදන සේවා** | **-12.0** | **-24.9** | **107.5** | **-135.9** | **-150.8** | **11.0** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **0.3** | **8.3** | | **25.2** | **38.5** | **52.9** |
| **ප්‍රවාහනය** | **73.6** | **35.1** | **-52.3** | **621.0** | **611.1** | **-1.6** |
| මුහුදු ප්‍රවාහනය | 50.1 | 68.9 | 37.5 | 387.0 | 547.5 | 41.5 |
| මගී ගාස්තු | -1.0 | -0.4 | -61.6 | -2.3 | 0.3 | -111.8 |
| නැව් කුලී | 12.1 | 38.5 | 217.6 | 132.8 | 253.8 | 91.1 |
| වෙනත් | 38.9 | 30.7 | -21.1 | 256.5 | 293.4 | 14.4 |
| ගුවන් ප්‍රවාහනය | 25.0 | -33.5 | -234.0 | 237.6 | 67.1 | -71.8 |
| මගී ගාස්තු | 0.4 | 3.0 | | 41.4 | -0.4 | -100.9 |
| ගුවන් කුලී | 2.4 | -24.3 | | 8.4 | -67.6 | |
| වෙනත් | 22.2 | -12.3 | -155.2 | 187.8 | 135.0 | -28.1 |
| තැපැල් සේවා | 0.02 | -0.3 | | -3.6 | -3.4 | -3.7 |
| **සංචාරක** | **134.4** | **77.1** | **-42.6** | **1,347.4** | **1,782.8** | **32.3** |
| **ඉදිකිරීම්** | **56.2** | **13.5** | **-76.0** | **196.5** | **60.4** | **-69.3** |
| විදේශයන්හි ඉදිකිරීම් | 2.3 | 3.6 | 54.1 | 25.4 | -9.8 | -138.5 |
| දේශීය ඉදිකිරීම් | 15.8 | 9.8 | -38.1 | 99.5 | 65.1 | -34.6 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 38.0 | 0.1 | -99.7 | 71.5 | 5.0 | -93.0 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **-2.7** | **-4.4** | **61.5** | **-10.6** | **-27.7** | **160.8** |
| සෘජු රක්ෂණය | -0.2 | -0.2 | -24.3 | 15.9 | 6.3 | -60.1 |
| ප්‍රතිරක්ෂණය | -2.5 | -4.2 | 68.3 | -26.5 | -34.1 | 28.5 |
| **මූල්‍ය සේවා** | **-0.7** | **-0.4** | **-49.4** | **6.6** | **-5.3** | **-181.0** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **-7.9** | **-13.2** | **66.5** | **-50.2** | **-100.2** | **99.7** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **65.4** | **44.6** | **-31.7** | **499.4** | **549.1** | **10.0** |
| විදුලි සංදේශ සේවා | 4.3 | -1.9 | -144.9 | 61.6 | 51.6 | -16.2 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 61.1 | 46.6 | -23.8 | 437.8 | 497.5 | 13.6 |
| පරිගණක සේවා | 63.9 | 46.9 | -26.6 | 475.1 | 511.7 | 7.7 |
| තොරතුරු සේවා | -2.9 | -0.3 | -88.2 | -37.3 | -14.1 | -62.1 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **1.6** | **11.0** | | **-28.8** | **-35.7** | **24.0** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | -3.9 | -2.6 | -32.96 | -39.5 | -39.8 | 0.6 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 7.0 | 15.6 | 121.5 | 5.6 | 4.4 | -20.9 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | -1.6 | -2.0 | 25.5 | 5.1 | -0.4 | -106.9 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **0.7** | **0.360** | **-52.0** | **18.0** | **5.0** | **-72.2** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.005 | 0.1 | | -3.0 | -3.3 | 10.4 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 0.7 | 0.2 | -67.7 | 21.0 | 8.3 | -60.4 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **0.04** | **8.9** | | **-2.5** | **28.7** | |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව